# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
## පරිසර අමාත්‍යාංශය

## ඇබෑර්තු - අධ්‍යක්ෂ (නීති) HM 1-2

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත කරනලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා ඉහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### බාහිර අයදුම්කරුවන්

**අධ්‍යාපනික හා වෘත්තීමය : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් (LLB) ලබාතිබීම හා නීතිඥයෙකු වීම

සමග

නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම ලබා තිබීම

සහ

තනතුරට අදාළව නීති කටයුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද හෝ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ක්‍රියාකාරී පළපුරුද්ද

හෝ

02. නීති ක්ෂේත්‍රයට අදාළ, පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) සහිත නීතිඥයකු වීම.

සහ

තනතුරට අදාළව නීති කටයුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද හෝ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ක්‍රියාකාරී පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

02. තනතුරට අදාළව නීති ක්ෂේත්‍රයේ "කළමනාකාර කාණ්ඩයේ" (MM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම

**වැටුප් පරිමාණය:** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වේ.

HM 1-2-රු. 81,670-15X2,270-115,720+ජීවන වියදම් දීමනාව සහ වෙනත් අනුමත දීමනා.

(වෘත්තීය දීමනාව - MSD චක්‍රලේඛ අංක 5/2017 පරිදි)

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

### තනතුරට අදාළ පොදු කොන්දේසි :

* තෝරාගනු ලබන අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතුය. කාර්යාංශය සේවක අර්ථසාධක අරමුදලට 15% ක්ද සේවක භාරකාර අරමුදලට (ETF) අමතර 3% ක්ද ලබා දෙනු ඇත.
* පවත්නා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ 1/2015 කොන්දේසි අනුව අනුමත ඉන්ධන දීමනාව සමග වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් සපයනු ලැබේ.
* රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
* බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට හිමිකම් ඇත.
* රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
* අයදුම්කරුවන්ගේ සත්‍යයේක්ෂණය සඳහා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතේ සඳහන් කළ යුතුය.
* අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට, 2023 මැයි 10 වැනිදා හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ලැබෙන්නට සැලැස්විය යුතුය. කෙටි ලැයිස්තු ගත කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**සභාපති,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**නො.569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**